**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.**

1. **සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව :- පළාත් පාලන දෙපාර්තමේන්තුව(බ.ප)
යොමු අංකය :- එල්ජීඩී/02/21/03/69-1
දිනය :- 2014.09.25

1.2 අමාත්‍යාංශය :- පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)
යොමු අංකය :-සීඑම්/ඩබ්පී/ඊ15/5/1-7
දිනය :- 2014.10.02

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :- යොමු අංකය :- ඩීඑම්එස්/ඩී/පොදු/11-2
දිනය :- 2012.12.19

1.4 ප්‍රධාන ලේකම්(බ.ප) නිර්දේශය :- යොමු අංකය :- CSO/PTR/15/3/3
දිනය :- 2014.10.22

1.5 වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :-
දිනය :-

1.6 බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :- යොමු අංකය :- 1/4/2/5/99
දිනය :- 2015.01.02

1.7 ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය :- යොමු අංකය :- 1/1/4/254
දිනය :- 2015.01.02

2. **පත් කිරීම් බලධාරියා** :- මහා නගර සභාවක නාගරික කොමසාරිස් වන අතර නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක ලේකම් වේ.

ක්‍රියාත්මක වන දිනය :- ගරු ආණ්ඩුකාරතුමා අනුමත කළ දින සිට ක්‍රියාත්මක වේ.

3. **සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය :- කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණය.

3.2 ශ්‍රේණි :- III, II, I ශ්‍රේණි වලින් සමන්විතයි.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :- ආයතනයන්හි විධායක කළමනාකරණ හා පරිපාලන කාර්යයන්හි නියුතු වූවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා/හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූද, ඒකළ ස්වරූපයේ වූද (Single Functional) කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්කිරීම් බලධරයා විසින් විශේෂයෙන් නියම කොට දක්වන ලද කාර්යයන් මෙම සේවා ගණයට අයත් නිලධරයන් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

3.4 කාර්යයන් පැවරීම :- ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජොෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

අනුමත කරමි / නොකරමි.
දිනය 2015.01.02
ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී. යොමු අංකය 1/1/4/254 දිනය 2015.01.02

4. තනතුරෙහි/තනතුරුවල ස්වභාවය :- ස්ථිර, විශ්‍රාම වැටුප් සහිතය.

5. වැටුප්

5.1 වැටුප් කේත අංකය :- MN 1 – 2006A

5.2 වැටුප් පරිමාණය :- රු. 13120-10x 145-11x170-10x240-10x320-22040/-

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර :-

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| III | පියවර 1 | 13,120/- |
| II | පියවර 12 | 14,740/- |
| I | පියවර 23 | 16,680/- |

6. සේවා ගණයට අයත් තනතුර/තනතුරු :-

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :-

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| ආදායම් පරීක්ෂක | III,II,I ශ්‍රේණි | 255 | • පළාත් පාලන ආයතනයට අදාළ සියලු බදු කුලී හා ගාස්තු අය කිරීම.<br>• හිඟ බදු අය කිරීමට අදාළ නීතිමය කටයුතු සිදු කිරීම.<br>• රථවාහන නැවතුම්වල බදු අය කර ගැනීම පරීක්ෂා කිරීම.<br>• බදු අය කිරීමට පත් කර ඇති යටත් සේවකයින් පාලනය කිරීම.<br>• වරිපනම් ලේඛනයේ නම් සංශෝධනය කිරීමේදී නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන අනුව බදු සහන ලබා දීමට නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• විනෝද බදු අය කිරීම හා ඊට අදාළ දෛනික වාර්තා ඉදිරිපත් කිරීම.<br>• වාර්ෂික බලපත්‍ර ලබා දීම සඳහා අයදුම්පත් ලබා ගැනීම හා අය කිරීම සහ කර්මාන්ත වෙළෙඳ බලපත්‍ර හා ඉඩම් විකිණීම සම්බන්ධ තක්සේරු ලබා දීම.<br>• වරිපනම් වලට අදාළ පෝරම නියමිත වේලාවට බෙදා දීම.<br>• වරිපනම් හා බදු කුලී අය කිරීමට අදාළ අවසන් දැන්වීම,(රතු දැන්වීම) බෙදා හැරීම.<br>• සභාවේ දේපළ බදු දීම හා වෙන්දේසි කිරීම.<br>• දේපළ සම්බන්ධයෙන් තාවකාලික තක්සේරු ඉදිරිපත් කිරීම.<br>• අවශ්‍ය අවස්ථාවල දී පරිසර කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කිරීම හා ඊට සහාය වීම.<br>• මහා නගර සභා ආඥා පනත, නගර සභා ආඥා පනත හා ප්‍රාදේශීය සභා පනතේ විධිවිධානවලට අනුව දේපළ තහනම් කිරීමට අදාළ නීතිමය කටයුතු කිරීමට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• බදු අය කිරීම් වලට අදාළ වැටලීම් කටයුතු සඳහා සහාය වීම.<br>• වීථි රේඛා සහතික සහ ගොඩනැඟිලි අයදුම්පත් සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.<br>• පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ආදායම් එක් රැස් කිරීම හා ආදායම් ප්‍රවර්ධනයට අදාළ අතුරු නීති සම්පාදනයට සහාය වීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :- ඒ ඒ පළාත් පාලන ආයතනයට අනුමත සේවක සංඛ්‍යාව වේ.

(ආදායම් පරීක්ෂක තනතුර අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව ඇමුණුම 01 හි දක්වා ඇත.)

ශ්‍රේණිගත උසස් කිරීමේ කාර්යය සඳහා ඒ ඒ පළාත් පාලන ආයතනයට අනුමත සේවක සංඛ්‍යාව තුළ සේවා ගණයේ III,II හා I ශ්‍රේණි සියල්ල ඒකාබද්ධ සේවක සංඛ්‍යාවක් සේ සැලකේ.

## 7. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :-

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | 100% |
| කුසලතා | - |

සටහන :- සීමිත අයදුම්කරුවන්ගෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වන අවස්ථාවල දී විවෘතව අයදුම්පත් කැඳවා පුරප්පාඩු පුරවනු ලැබේ.

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.2.2 සුදුසුකම්

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් :- සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.2.2.3 පළපුරුද්ද :- අදාළ නැත

7.2.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :-

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.
iii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.

7.2.3 වයස

7.2.3.1 අවම සීමාව :- අවුරුදු 18ට නොඅඩු විය යුතුය.

7.2.3.2 උපරිම සීමාව :- අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.2.4.1 ලිඛිත විභාගය

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| සාමාන්‍ය දැනීම | 100 | 40% |

පළාත් ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/254 දිනය : 2015.01.02

සටහන :- ලිඛිත පරීක්ෂණයේ දී අයදුම්කරුවන් ලකුණු ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආදායම් පරීක්ෂක III ශ්‍රේණියට බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය - ඇමුණුම 02.)

7.2.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා

7.2.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :- මෙහිදී ලකුණු ලබා දෙනු නොලැබේ. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පවත්වනු ලැබේ.

7.2.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

7.2.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය :- III ශ්‍රේණිය.

7.3.2 සුදුසුකම්

7.3.2.1 අධ්‍යාපන සුදුසුකම් :- අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාවට සහ ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 02ක් සහිතව විෂයන් 06කින් සාමාර්ථ ලබා තිබීම. (මින් විෂයන් පහ (05) ක් එකවර සමත් වී තිබිය යුතුයි.)

7.3.2.2 වෘත්තීය සුදුසුකම් :- අදාළ නැත.

7.3.2.3 පළපුරුද්ද :- අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රාථමික සේවා ගණයක වැටුප් ලබන සේවය ස්ථිර කර ඇති හා වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති සේවකයින් විය යුතු අතර, මෙම කාලය තුළ කිසිදු විනය දඬුවමක් ලබා නොතිබිය යුතුය.

7.3.2.4 කායික සුදුසුකම් :- තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

7.3.2.5 වෙනත් :-

i. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
ii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයෙන්ම සපුරා තිබිය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී
ගොනු අංකය : 1/1/4/25/4 දිනය : 2015.04.02

7.3.3 වයස

7.3.3.1 අවම සීමාව :-
7.3.3.2 උපරිම සීමාව :-

දැනටමත් අදාළ පළාත් පාලන ආයතනයේ සේවයේ නියුතු ස්ථිර සේවකයින්ගෙන් බඳවා ගන්නා බැවින් වයස් සීමාව අදාළ නොවේ.

7.3.4 බඳවා ගැනීමේ ක්‍රමය

7.3.4.1 ලිඛිත විභාගය :-

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | 100 | 40% |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | 100 | 40% |

7.3.4.1.1 පවත්වන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

(ආදායම් පරීක්ෂක III ශ්‍රේණියට බඳවා ගැනීමේ (සීමිත) තරග විභාගය සඳහා වන විෂය නිර්දේශය - ඇමුණුම 03)

7.3.4.2 වෘත්තීය පරීක්ෂණය :- අදාළ නැත.

7.3.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණ :- සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ.

7.3.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :-
අදාළ පත්කිරීම් බලධරයා

7.3.4.4 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :- අදාළ නැත.

7.3.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :- ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම :- අදාළ නැත.

## 8. කාර්යක්ෂමතා කඩඉම

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙර ද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය/ වෘත්තීය පරීක්ෂණය/ සහතික පාඨමාලාව/ වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III ශ්‍රේණියට බඳවා ගෙන වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 04) |
| 2 වන කාර්යක්ෂමතා කඩඉම | II ශ්‍රේණියට උසස් වී වසර 03ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 05) |
| 3 වන කාර්යක්ෂමතා කඩඉම | I ශ්‍රේණියට උසස් වී වසර 05ක් ගත වීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම අංක 06) |

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද? :-
වසරකට වරක් හෝ අවශ්‍යතාව පරිදි.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ලිපිගොනු අංකය : 1/1/4/7254 දිනය : 2015.01.02

8.3 කාර්යක්ෂමතා කඩඉම් වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයන් කවුරුන්ද? :-

1 වන කාර්යක්ෂමතා කඩඉම
2 වන කාර්යක්ෂමතා කඩඉම
3 වන කාර්යක්ෂමතා කඩඉම
} අදාළ පත්කිරීම් බලධරයා.

## 9. භාෂා ප්‍රවීණතාවය

9.1

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීණතාවය |
|---|---|
| 1. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. |
| 2. අනෙක් රාජ්‍ය භාෂාව | රා.ප.ච.01/2014 චක්‍රලේඛයේ විධිවිධානයන්ට අනුව අදාළ මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |
| 3. සන්ධාන භාෂාව | අදාළ නැත. |

## 10. ශ්‍රේණි උසස් කිරීම

10.1 <u>III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරීම.</u>

10.1.1 III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. පත්වීම ස්ථිර කර තිබීම.
II. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය(10)ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලයට නියමිත සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
III. අනුමත කාර්ය සාධන ඇගයීම් පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර දහය(10) තුළ ම සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
IV. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
V. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගෙන තිබීම.
VI. III ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.1.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම අංක 07) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධරයා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, III ශ්‍රේණියේ වසර දහය(10) සම්පූර්ණ කරන දින හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි II ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.2 <u>II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරීම</u>

10.2.1 II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය අනුව උසස් කිරීම.


ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/254 දිනය : 2015.01.02

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම් :-

I. සේවා ගණයේ II ශ්‍රේණියේ අවම වශයෙන් වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබීම.
II. අනුමත කාර්යසාධන ඇගයීම් පරිපාටිය අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර දහය (10) තුළම සතුටුදායක හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
III. උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
IV. II ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :-

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා, නියමිත ආකෘති පත්‍රය (ඇමුණුම අංක 07) අනුව පත්කිරීම් බලධරයා වෙත අදාළ නිලධාරියා විසින් ඉල්ලීමක් කරනු ලැබූ විට පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව II ශ්‍රේණියේ වසර දහය (10) සම්පූර්ණ කරන දිනය හෝ සුදුසුකම් සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දින සිට ක්‍රියාත්මක වන පරිදි I වන ශ්‍රේණියට උසස් කිරීම පත්කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

10.3 <u>I වන ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම</u> :- අදාළ නැත.

**11.** තනතුරුවලට පත් කිරීම :- අදාළ නැත.

**12.** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, බස්නාහිර පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයට ද, කලින් කල බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යංශය හා දෙපාර්තමේන්තු නියෝගවලට ද ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරනු ලබන නියෝගවලට ද අනුව කටයුතු කළ යුතුය.

**13.** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :-

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ කිසිවක් වෙතොත් ඒ සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව / බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා කටයුතු කරනු ඇත.

**14.** ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය

- මෙම පරිපාටිය අනුමත වන දිනට <u>ආදායම් පරීක්ෂක තනතුරේ</u> සේවය කරන නිලධාරීන් පහත සඳහන් අයුරින් නව පරිපාටියට අන්තර්ග්‍රහණය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/25.4 දිනය : 2015.01.02

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරික්ෂක II ශ්‍රේණියේ වසර 10 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් ආදායම් පරීක්ෂක II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

මෙම පරිපාටිය අනුමත කරන දිනට දැනට ආදායම් පරීක්ෂක II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා ඇතත්, අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරීන් ආදායම් පරීක්ෂක II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරික්ෂක II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා ඇති, අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් ආදායම් පරීක්ෂක I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරීක්ෂක I ශ්‍රේණියේ සිටින නිලධාරීන් ආදායම් පරීක්ෂක I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

❖ **මෙම පරිපාටිය අනුමත වන දිනට ආදායම් පරිපාලක ලෙස සේවය කරන නිලධාරීන් පහත සඳහන් අයුරින් නව පටිපාටියට අන්තර්ග්‍රහණය කෙරේ.**

III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරිපාලක II ශ්‍රේණියේ වසර 10 සපුරා නොමැති නිලධාරීන් මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දිනට ආදායම් පරීක්ෂක III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරිපාලක II ශ්‍රේණියේ වසර 10 ක සේවා කාලයක් සපුරා ඇතත්, අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරීන් ආදායම් පරීක්ෂක III ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරිපාලක II ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා ඇති, අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් ආදායම් පරීක්ෂක II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

මෙම පරිපාටිය අනුමත කරන දිනට ආදායම් පරිපාලක I ශ්‍රේණියේ වසර 10ක සේවා කාලයක් සපුරා ඇතත්, අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් වී නොමැති නිලධාරීන් සහ I ශ්‍රේණියේ වසර 10 ට අඩු සේවා කාලයක් ඇති නිලධාරීන් ආදායම් පරීක්ෂක II ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කිරීම :-

මෙම පරිපාටිය ක්‍රියාත්මක දිනට ආදායම් පරිපාලක I ශ්‍රේණියේ වසර 10 සේවා කාලයක් ඇති හා අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් මෙම පටිපාටියට අනුව ආදායම් පරීක්ෂක I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කෙරේ.

සටහන :-

- **ආදායම් පරිපාලක තනතුරේ සේවය කරමින් සිට මෙම පරිපාටිය අනුව ආදායම් පරීක්ෂක තනතුරේ** III, II, I ශ්‍රේණිවලට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන්, මෙම පරිපාටියට අනුව III, II, I ශ්‍රේණි වලට අන්තර්ග්‍රහණය කරන ලද ආදායම් පරීක්ෂක නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානි නොවන අන්දමින් ජ්‍යෙෂ්ඨතා ලේඛනයේ ඔවුන්ට පහළින් තබා කටයුතු කළ යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/4/4/254 දිනය : 2015.01.02

- අන්තර්ග්‍රහණයෙන් අනතුරුව අදාළ ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

- අන්තර්ග්‍රහණය කරන දිනට අන්තර්ග්‍රහණය කරන තනතුරට පත්වීමට අවශ්‍ය සේවා කාලයට වඩා වැඩිපුර සේවය කර ඇති සේවා කාලය ඊළඟ ඉහළ තනතුරට උසස් කිරීමේදී අවශ්‍ය සේවා කාලය සඳහා සලකා බලනු ලැබේ.

- අන්තර්ග්‍රහණය කරනු ලැබූ නිලධාරීන් සියලු දෙනා මෙම පරිපාටිය ක්‍රියාත්මක වන දින සිට පහත සඳහන් පරිදි MN-1 2006 A කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුරේ අදාළ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ. අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට අනුව සිදු කරනු ලබන අතර, අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ නිලධාරීන්ගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවන අතර, වැටුප් පරිවර්තනයේ දී අදාළ නිලධාරියා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII වන පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තිබීමද සිදු නොකළ යුතුය.

**15. මෙම පරිපාටියේ විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විමසා තීරණය කරනු ඇත.**

**16. අර්ථ නිරූපණ.**

➢ <u>සතුටුදායක සේවා කාලය:</u>

(i) පළාත් සභා රාජ්‍ය සේවයේ සේවකයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරිය ඉටු කිරීම මගින් ද, සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් සමත් වීම මගින් ද, සිදු කළ යුතුව තිබූ පත්වීම ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින් ද, එම කාලය තුළ දී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ ඔහු විසින් දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්දා වූ කාලසීමාවක් වන්නේය.

(ii) සේවකයා වෙත ලබා දිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නීත්‍යානුකූල හේතු මත අත්හිටුවා, අඩු කොට, නතර කොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එය ද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ පළමු වැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර 03ක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ, වැරදි පිළිබඳ දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට එක් වසරක කාලයක් ද සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

➢ <u>සක්‍රීය සේවා කාලය:-</u>

'සක්‍රීය සේවා කාලය' යනු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සත්‍ය වශයෙන් ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියලුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයෙන් සක්‍රීය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/954 දිනය : 2015.09.02

➢ නියමිත දිනට:-

අදාළ කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුතු දිනය 'නියමිත දිනය' ලෙස අදහස් කෙරේ. ශ්‍රේණි උසස්වීම්වලදී නියමිත දිනට හෝ ඊට පෙර කාර්යක්ෂමතා කඩඉම සමත්වන නිලධාරීන්ට බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි උසස්වීම් ලැබීමට හිමිකම් ඇත. නියමිත දිනට සමත් නොවන නිලධාරීන්ගේ උසස්වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කළ යුතුය.

සකස් කළේ : ..........
නම : ..........
තනතුර : ..........
දිනය : ..........

පරීක්ෂා කළේ : ..........
නම : ..........
තනතුර : ..........
දිනය : ..........

පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.)

2014/9/18

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..........
තනතුර : ..........
දිනය : ..........

පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත

9/25

---

යොමු අංකය : CM/WP/E15/5/1-7

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........
අමාත්‍යාංශ ලේකම් (බ.ප)

දිනය : 2014/10/02

නිල මුද්‍රාව:

32, ශ්‍රීමත් මාකන් මාකර් මාවත,
කොළඹ 07.

---

යොමු අංකය : CSO/PTR/15/3/3

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හි ආදායම් පරීක්ෂක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........
ප්‍රධාන ලේකම් (බ.ප)

දිනය : 2014-10-22

නිල මුද්‍රාව:

ජේ. එම්. සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම් - බස්නාහිර පළාත

---

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/254 දිනය : 2015.01.02

යොමු අංකය : 1/4/2/5/99

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හී ආදායම් පරීක්ෂක තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........

ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප)

දිනය : 2015.01.02

නිල මුද්‍රාව: ලේකම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව බස්නාහිර පළාත

---

යොමු අංකය : 1/1/4/254

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනයන්හී ආදායම් පරීක්ෂක තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය 2015.01.02 දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදි.

අත්සන : ..........

ආණ්ඩුකාර ලේකම් (බ.ප),

දිනය : 2015.01.02

නිල මුද්‍රාව: බ.ප. ආණ්ඩුකාර ලේකම් බ.ප. ආණ්ඩුකාර ලේකම් කාර්යාලය 98/4, හැව්ලොක් පාර, කොළඹ 05.

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
යොමු අංකය : 1/1/4/254 දිනය : 2015.01.02

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුරු අනුමත ආයතන හා තනතුරු සංඛ්‍යාව.

| අනු අංකය | පළාත් පාලන ආයතනය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| 1. | කොළඹ මහා නගර සභාව | |
| 2. | දෙහිවල ගල්කිස්ස මහ නගර සභාව | 36 |
| 3. | ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව | 09 |
| 4. | මොරටුව මහ නගර සභාව | 07 |
| 5. | කඩුවෙල මහ නගර සභාව | 12 |
| 6. | මීගමුව මහ නගර සභාව | 13 |
| 7. | ගම්පහ මහ නගර සභාව | 08 |
| 8. | කොලොන්නාව නගර සභාව | 07 |
| 9. | සීතාවකපුර නගර සභාව | 04 |
| 10. | මහරගම නගර සභාව | 04 |
| 11. | කැස්බෑව නගර සභාව | 07 |
| 12. | බොරලැස්ගමුව නගර සභාව | 04 |
| 13. | වත්තල මාබෝල නගර සභාව | 03 |
| 14. | කටුනායක සීදුව නගර සභාව | 03 |
| 15. | මිනුවන්ගොඩ නගර සභාව | 05 |
| 16. | ජා ඇල නගර සභාව | 02 |
| 17. | පෑලියගොඩ නගර සභාව | 03 |
| 18. | පානදුර නගර සභාව | 03 |
| 19. | හොරණ නගර සභාව | 06 |
| 20. | කළුතර නගර සභාව | 05 |
| 21. | බේරුවල නගර සභාව | 03 |
| 22. | කෝට්ටේ මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව | 04 |
| 23. | සීතාවක ප්‍රාදේශීය සභාව | 04 |
| 24. | හෝමාගම ප්‍රාදේශීය සභාව | 04 |
| 25. | වත්තල ප්‍රාදේශීය සභාව | 05 |
| 26. | කටාන ප්‍රාදේශීය සභාව | 04 |
| 27. | දිවුලපිටිය ප්‍රාදේශීය සභාව | 05 |
| 28. | මීරිගම ප්‍රාදේශීය සභාව | 04 |
| 29. | මිනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව | 04 |
| 30. | අත්තනගල්ල ප්‍රාදේශීය සභාව | 04 |
| 31. | ගම්පහ ප්‍රාදේශීය සභාව | 06 |
| 32. | ජා ඇල ප්‍රාදේශීය සභාව | 04 |
| 33. | මහර ප්‍රාදේශීය සභාව | 04 |
| 34. | දොම්පෙ ප්‍රාදේශීය සභාව | 05 |
| 35. | බියගම ප්‍රාදේශීය සභාව | 06 |
| 36. | කැලණිය ප්‍රාදේශීය සභාව | 04 |
| 37. | මදුරාවල ප්‍රාදේශීය සභාව | 03 |
| 38. | බුලත්සිංහල ප්‍රාදේශීය සභාව | 03 |
| 39. | මතුගම ප්‍රාදේශීය සභාව | 03 |
| 40. | දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව | 04 |
| 41. | කළුතර ප්‍රාදේශීය සභාව | 04 |
| 42. | පානදුර ප්‍රාදේශීය සභාව | 04 |
| 43. | බණ්ඩාරගම ප්‍රාදේශීය සභාව | 04 |
| 44. | හොරණ ප්‍රාදේශීය සභාව | 05 |
| 45. | බේරුවල ප්‍රාදේශීය සභාව | 04 |
| 46. | පාලින්දනුවර ප්‍රාදේශීය සභාව | 05 |
| 47. | අගලවත්ත ප්‍රාදේශීය සභාව | 01 |
| 48. | වලල්ලාවිට ප්‍රාදේශීය සභාව | 02 |
| | එකතුව | 02 |
| | | 255 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/25/4 දිනය 2015.01.02

ඇමුණුම 02.

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල**
**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ**
**ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගය (විවෘත).**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - (විවෘත)

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 % |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝගතාව හා බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව, භාෂා හැකියාව මැන බැලීම. |
| සාමාන්‍ය දැනීම | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් යුක්ත වේ. |

අත්සන : ..............................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..............................
තනතුර : ..............................
දිනය : ..............................

චන්ද්‍රානි සමරකෝන්
පළාත් පාලන කොමසාරිස්
බස්නාහිර පළාත

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :- 1/1/4/254 දිනය :- 2015.01.02

ඇමුණුම 03.

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල**
**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ**
**ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන ලිඛිත තරග විභාගය (සීමිත).**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ආදායම් පරීක්ෂක තනතුරෙහි III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත තරග විභාගය - (සීමිත)

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 % |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | පැය 01 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්වීම් බලධරයා

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- ඇතිවන පුරප්පාඩු සංඛ්‍යාව සලකා බැලීමෙන් පසුව.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය:

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| සාමාන්‍ය දැනුම හා බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය ආර්ථික, සාමාජයීය, අධ්‍යාපන, විද්‍යාත්මක, සංස්කෘතික, දේශපාලනික මෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයට අදාළ දේශීය, විදේශීය වශයෙන් වැදගත් වන්නා වූ කාලීන සිද්ධීන් පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම මැනීම සඳහා සකස් කෙරෙන ප්‍රශ්න වලින් හා අපේක්ෂකයාගේ භාෂා හැකියාව, තර්කන ශක්තිය හා ගණිතමය හැකියාව පරීක්ෂා කිරීම සඳහා සකස් වූවකි. |
| ක්ෂේත්‍රයට අදාළ දැනුම පරීක්ෂා කිරීම | ▪ මහා නගර සභා අණ පනත, නගර සභා අණ පනත හා ප්‍රාදේශීය සභා පනත මඟින් ආදායම් එක් රැස් කිරීම පිළිබඳව පැවරී ඇති බලතල.<br>▪ පළාත් පාලන ආයතනයක ඇති ආදායම් උත්පාදන ප්‍රභවයන්.<br>▪ කර්මාන්ත බදු, ව්‍යාපාර බදු, බලපත්‍ර ගාස්තු පැනවීම හා එක් රැස් කිරීම, නොගෙවන අවස්ථාවලදී නීතිමය කටයුතු කිරීම.<br>▪ අයවැය ඇස්තමේන්තු සැකසීමේදී ආදායම් පරීක්ෂකගේ දායකත්වය.<br>▪ වරිපනම් බදු, අක්කර බදු පැනවීම, දැන්වීම් නිකුත් කිරීම, අධි ගාස්තු පැනවීම, වට්ටම් ලබා දීම ආදිය පිළිබඳ මූලික දැනුම පරීක්ෂා කිරීම. |

අත්සන : ..........H..........
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........[illegible]..........
තනතුර : ..පළාත් පාලන කොමසාරිස්
දිනය : ..........බස්නාහිර පළාත..........
9/21

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 1/1/4/254 දිනය 2015.01.02

ඇමුණුම 04

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල**
**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ**
**ආදායම් පරීක්ෂක තනතුරෙහි 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත).**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ආදායම් පරීක්ෂක තනතුරෙහි 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත).

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | පැය 01 | 100 | 40 % |
| පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නීතිය. | පැය 01 | 100 | 40% |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ VII, VIII, XII පරිච්ඡේද පිළිබඳ මූලික දැනුම හා පළාත් මූල්‍ය රීති පිළිබඳ මූලික දැනුම මැන බැලීම.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>I පරිච්ඡේදයේ 1,2,3 කොටස්<br>II පරිච්ඡේදයේ 1 කොටස<br>IV පරිච්ඡේදයේ 2 කොටස<br>V පරිච්ඡේදයේ 1,2,3,4 කොටස් සම්බන්ධ දැනුම. |
| පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නීතිය | ▪ පළාත් පාලන ආයතනයක නව ආදායම් මාර්ග හඳුනා ගැනීම හා ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් අදාළ මූලික දැනුම පරීක්ෂා කිරීම.<br>▪ මහා නගර සභා අණ්ඩ පනත, නගර සභා ආඥා පනත සහ ප්‍රාදේශීය සභා පනත් වල ආදායම් සම්බන්ධයෙන් ඇති වගන්ති.<br>▪ ආදායම් විෂයයන්ට අදාළ අනෙකුත් අණ පනත්.<br>o විනෝද බදු ආඥා පනත.<br>o ගෝඝාතක ආඥා පනත.<br>o වරිපනම් තක්සේරු ආඥා පනත.<br>o වෙන්දේසි කරුවන් හා බ්‍රෝකර්වරුන් පිළිබඳ ආඥා පනත<br>o සමාජ ශාලා වලට බලපත්‍ර දීමේ නීතිය.<br>▪ චෝදනා පත්‍ර හා දිවුරුම් ප්‍රකාශ සකස් කිරීම පිළිබඳ දැනුම. |

අත්සන : ......[signature]......
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ......චන්ද්‍රානි සමරසේකර......
තනතුර : ......පළාත් පාලන කොමසාරිස් බස්නාහිර පළාත......
දිනය : ......14/4/25......

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
අංකය : 1/1/4/254 දිනය : 2016.01.

ඇමුණුම 05

බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ
ආදායම් පරීක්ෂක තනතුරෙහි 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත).

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ආදායම් පරීක්ෂක තනතුරෙහි 2 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය(ලිඛිත).

2. විභාගය/ වෘත්තිය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නිතිය. | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ IX, XIV, XVII, XXVII, XXXII, පිළිබඳ දැනුම හා පළාත් පාලන මූල්‍ය රීති පිළිබඳ දැනුම.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>I පරිච්ඡේදයේ 4,5 කොටස්.<br>II පරිච්ඡේදයේ 2,3 කොටස්.<br>VI පරිච්ඡේදයේ 1,2,3 කොටස්.<br>VII පරිච්ඡේදයේ 1,2,4 කොටස් සම්බන්ධ දැනුම. |
| පළාත් පාලන ආයතනවල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නිතිය. | ▪ ආදායම් විෂයට අදාළ අණපනත් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම.<br>○ 1992 අංක 5 දරණ මුද්දර ගාස්තු ප්‍රඥප්තිය.<br>○ 1994 අංක 7 දරණ උසාවි දඩ මුදල් පැනවීම සඳහා වන ප්‍රඥප්තිය.<br>○ එකතු කළ අගය මත බදු අයකිරීම.(VAT)<br>○ 1987 අංක 42 දරණ පළාත් සභා පනත. |
| | ▪ ආදායම් විෂයයට අදාළ අතුරු ව්‍යවස්ථා පිළිබඳ දැනුම.<br>▪ පරිසර පනත. |

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........................
තනතුර : ..........................
දිනය :

පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප)
අංක 02, සේම්බ්‍රිජ් ටෙරසය,
කොළඹ-07.

හැ. ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය :1/1/4/25 4 දිනය : 2015.01.12

1

ඇමුණුම 06

**බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල**
**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ**
**ආදායම් පරීක්ෂක තනතුරෙහි 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.(ලිඛිත).**

1. විභාගයේ/ වෘත්තිය පරීක්ෂණයේ නම :- ආදායම් පරීක්ෂක තනතුරෙහි 3 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය (ලිඛිත).

2. විභාගය/ වෘත්තීය පරීක්ෂණය පිළිබඳ විස්තර :-

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | පැය 01 විනාඩි 30 | 100 | 40 % |
| පළාත් පාලන ආයතන වල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නීතිය. | පැය 02 | 100 | 40 % |

3. පවත්වනු ලබන බලධරයා :- අදාළ පත්කිරීම් බලධරයා.

4. පවත්වනු ලබන්නේ කොපමණ කාලසීමාවකට වරක්ද යන වග :- වසරකට වරක් හෝ අවශ්‍යතාවය පරිදි.

5. විභාග සඳහා වන විෂය නිර්දේශය :-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| ආයතන කාර්ය පටිපාටිය හා පළාත් සභා මූල්‍ය රීති. | බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කාර්ය පටිපාටික රීති හා ආයතන සංග්‍රහයේ XV, XXIV, XXVII, XXVIII, XLVII; XLVIII පරිච්ඡේද පිළිබඳ දැනුම.<br>• පළාත් සභා මූල්‍ය රීති සංග්‍රහයේ<br>III පරිච්ඡේදය.<br>V පරිච්ඡේදයේ 5,6 කොටස්,<br>VI පරිච්ඡේදයේ 4,5 කොටස්<br>VIII පරිච්ඡේදයේ අත්තිකාරම් ගිණුම්,<br>X පරිච්ඡේදයේ 1,2,3,4,5 කොටස් සම්බන්ධ දැනුම. |
| පළාත් පාලන ආයතන වල ආදායම් එකතු කිරීම හා ඊට අදාළ පළාත් පාලන නීතිය. | • අධිකරණ සංවිධානය හා පළාත් පාලන ආයතනවල ආදායම් රැස් කිරීම සඳහා බල පවත්වනු ලබන නීති රෙගුලාසි.<br>• ශ්‍රී ලංකා අධිකරණ සංවිධානය.<br>• ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය.<br>• නව ආදායම් විෂයන්ට අදාළ අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කිරීම හා අවසන් අනුමැතිය දක්වා යන ක්‍රියා පටිපාටිය.<br>• ආදායම් විෂයට අදාළ පළාත් පාලන ආයතන වල යොදා ගනු ලබන අණ පනත් පිළිබඳ දැනුම. |

අත්සන : ..........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)
නම : ..........................
තනතුර : ..........................
දිනය : ..........................

ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/25-7 දිනය : 2015.01.02

ඇමුණුම 07

## බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - ඛණ්ඩ 2 සේවා ගණයේ ආදායම් පරීක්ෂක තනතුරෙහි ශ්‍රේණි උසස්වීම් ලබා ගැනීම සඳහා වූ අයදුම්පත්‍රය

1. නිලධාරියා පිළිබඳ තොරතුරු
   - 1.1 අයදුම්කරුගේ සම්පූර්ණ නම : ..........................................................................
   - 1.2 හැඳුනුම්පත් අංකය : ..........................................................................
   - 1.3 සේවා ස්ථානය හා එහි ලිපිනය : ..........................................................................
   - 1.4 අයත්වන සේවය හා තනතුර : ..........................................................................
   - 1.5 අයත්වන සේවා ගණය හා ශ්‍රේණිය : ..........................................................................

2 පත්වීම පිළිබඳ තොරතුරු
   - 2.1 පත්වීම් දිනය : ..........................................................................
   - 2.2 පත්වීම් ස්ථිර කළ දිනය : ..........................................................................
   - 2.3 සමත්වූ කාර්යක්ෂමතා කඩඉම හා සමත් දිනය:

| සමත්වූ කාර්යක්ෂමතා කඩඉම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

   - 2.4 සමත් වූ භාෂා ප්‍රවීනතා මට්ටම හා සමත් දිනය:

| සමත්වූ භාෂා ප්‍රවීණතා මට්ටම | සමත්විය යුතු දිනය | සමත්වූ දිනය |
|---|---|---|
| | | |

3 උසස් වීමට අදාළ තොරතුරු
   - 3.1 උසස් වීමට අපේක්ෂිත ශ්‍රේණිය : 11/1
   - 3.2 උසස් වීමට අපේක්ෂිත ධාරාව : ..........................................................................
     - 3.2.1 අවශ්‍ය සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
     - 3.2.2 සක්‍රිය සේවා කාලය සම්පූර්ණ කළ දිනය : ..........................................................................
     - 3.2.3 අපේක්ෂිත සක්‍රිය සේවා කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම්කර තිබේද? ඔව්/නැත.
     - 3.2.4 නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබේද? ඔව්/නැත.
       උසස්වීමට පූර්වාසන්න පස් වසර තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබේද? ඔව්/නැත.
     - 3.2.5 විනය දඬුවම් ලබා තිබේද? ඔව්/නැත.

4 අයදුම්කරුගේ ප්‍රකාශය.

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මා හට විරුද්ධව නොනිමි විනය පරීක්ෂණයක් නොමැති බවත් ........................... දින සිට සාමාන්‍ය කාර්යසාධනය යටතේ 11/1 ශ්‍රේණියට උසස්වීමට අදාළ සුදුසුකම් සපුරා ඇති බවත් සහතික කරමි.

..............................................

නිලධරයාගේ අත්සන.

දිනය:

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය : 1/1/4/254 දිනය : 2015.01.02

5 <u>දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ අංශ ප්‍රධානියාගේ නිර්දේශය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරැදි බවත්, ඉහත නම් සඳහන් ................................................ මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවටත් සෑහීමකට පත්වෙමි. ඒ අනුව එම සේවකයා ඉහත ශ්‍රේණියට උසස් කිරීම නිර්දේශ කරමි.

නම : .......................................
අත්සන : .......................................
දිනය : .......................................
නිල මුද්‍රාව: .......................................

6 <u>නාගරික කොමසාරිස්ගේ/ ලේකම්ගේ අනුමැතිය</u>

ඉහත සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරැදි බැවින්, ඉහත නම් සඳහන් ................................................ මහතා/මහත්මිය/මෙනෙවිය ......................................................සේවා ගණයේ ............. ශ්‍රේණියට සාමාන්‍ය කාර්යසාධනය යටතේ උසස් කිරීම සඳහා වූ සියලු කරුණු සම්පූර්ණ කර ඇති බවට සෑහීමකට පත්වෙමි. ඒ අනුව ...................................................................... මහත්මා/ මහත්මිය/ මෙනවිය ...................... දින සිට ................ ශ්‍රේණියට උසස් කිරීම අනුමත කරමි.

නම : ..........................................
අත්සන : ..........................................
දිනය : ..........................................
නිල මුද්‍රාව : ..........................................

ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.
ගොනු අංකය 4/1/4/254 දිනය 2015..01..02